# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2135/53 – 2019 අගෝස්තු මස 07 වැනි බදාදා – 2019.08.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක 68

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**
**10(1) (අ) වගන්තිය යටතේ විධානය**

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතෙහි 10(1) (අ) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව සියළුම නිෂ්පාදකයින්, ආනයනකරුවන් සහ වෙළෙන්දන් විසින් පහත උපලේඛනයෙහි සඳහන් සියළු භාණ්ඩ ඇසුරුම්වල, බහාලුම්වල හෝ එතුම්වල පහත දක්වා ඇති තොරතුරු සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවලින් පැහැදිළිව මුද්‍රණය කළයුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

(අ) උපරිම සිල්ලර මිල
(ආ) නිෂ්පාදන කාණ්ඩ අංකය
(ඇ) කල් ඉකුත්වන දිනය
(ඈ) නිෂ්පාදිත දිනය
(ඉ) ශුද්ධ බර /පරිමාව
(ඊ) ආනයනික රට / නිෂ්පාදිත රට
(උ) නැවත ඇසුරුම් කළ දිනය (තොග වශයෙන් ආනයනය කර නැවත ඇසුරුම් කරන ලද භාණ්ඩ හෝ තොග ලෙස අසුරා ඇති නිෂ්පාදිත භාණ්ඩවලින් නැවත ඇසුරුම් කරන ලද භාණ්ඩ)

උපලේඛනය

1. ඇසුරුම් කර විකුණනු ලබන මස් සහ මස් නිෂ්පාදන
2. ඇසුරුම් කර විකුණනු ලබන මාළු සහ වෙනත් මුහුදු ආහාර
3. ඇසුරුම් කළ තේ කොළ සහ තේ බෑග් පැකට්
4. ඇසුරුම් කළ කෝපි ඇට සහ කෝපි කුඩු

1A – PG4613 – 217(2019/08)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

5. චොකලට්, පිසීමට ගන්නා චොකලට් සහ කොකෝවා කුඩු
6. චට්නි වර්ග, අච්චාරු සහ සෝස් වර්ග
7. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත සහල්
8. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත පිටි (යම් ධාන්‍ය හෝ ඇට වර්ගවලින් සාදන පිටි)
9. කිරි පිටි (සම්පූර්ණ යොදය සහිත කිරි පිටි, මේද අඩු, මේද රහිත, ළදරු සහ මෝල්ටඩ්)
10. ඇසුරුම් කළ හෝ බහාලුම්ගතව විකුණනු ලබන සෝයා නිෂ්පාදන
11. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත සීනි
12. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත ධාන්‍ය සහ ඇට වර්ග
13. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත නූඩ්ල්ස්
14. ඇසුරුම් කර විකුණනු ලබන පාන් සහ බේකරි නිෂ්පාදන
15. රෝගී ආහාර සහ ආහාර අතිරේක
16. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත වියළි මිරිස්, මිරිස් කුඩු හෝ කෑලි මිරිස්
17. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කොත්තමල්ලි ඇට සහ කුඩු
18. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත අබ ඇට, කුඩු සහ අබ තලපය
19. ඇසුරුම් කර විකුණනු ලබන කරාබු නැටි සහ කරඳමුංගු
20. ඇසුරුම් කර විකුණනු ලබන කුරුඳු, කුරුඳු කුඩු
21. ඇසුරුම් කර විකුණනු ලබන සූදුරු ඇට සහ කුඩු
22. ඇසුරුම් කර විකුණනු ලබන මහදුරු ඇට සහ කුඩු
23. ඇසුරුම් කර විකුණනු ලබන උළුහාල් ඇට
24. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත තුනපහ කුඩු
25. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත ගම්මිරිස් ඇට සහ කුඩු
26. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කහ කුඩු සහ තලපය
27. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කර විකුණනු ලබන සුදුළූණු තලපය
28. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කර විකුණනු ලබන ගොරකා කුඩු හා තලපය
29. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කර විකුණනු ලබන කෑමට සුදුසු ලුණු කැට සහ මේස ලුණු
30. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කර විකුණනු ලබන විනාකිරි
31. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කර විකුණනු ලබන කරවල, උම්බලකඩ සහ උම්බලකඩ කැබලි
32. ටින් කළ මාළු
33. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කර විකුණනු ලබන බිත්තර
34. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කර විකුණනු ලබන විජලනික/වියළි පළතුරු සහ එළවළු
35. ටින් කල පළතුරු සහ එළවළු
36. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත පිසින ලද/ සකස් කරන ලද පළතුරු සහ එළවළු
37. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත පිසින ලද/සකස් කරන ලද ආහාර
38. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත පොල්කිරි, පොල් කිරි පිටි සහ වියළන ලද පොල්
39. මාගරින්, බටර්
40. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කපන ලද චීස් ද ඇතුළුව විවිධ චීස් වර්ග
41. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත මී කිරි සහ යෝගට්
42. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත පිටි කළ බීම වර්ග
43. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත දියර/නැවුම් කිරි (රස නොකළ, රස කළ හා පැණි රස යෙදූ)
44. උකු කළ කිරි
45. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත පළතුරු යුෂ, සිරප්, කෝඩියල්, සහ පිළිගැන්වීමට සුදුසු පළතුරු බීම වර්ග
46. සිසිල් බීම
47. බෝතල් කළ පානීය ජලය
48. ස්වාභාවික ඊස්ට් වලින් සාදන නිෂ්පාදන
49. මළු හෝ බහාලුම් තුළ ඇති ආහාර, වර්ණක, ආහාර රසකාරක, ආහාර සුවඳකාරක, ආහාර කල්තබා ගන්නා ද්‍රව්‍ය, ආහාර සඳහා යොදන අඩංගු කාරක
50. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත අමු, පුළුස්සන ලද ලුණු හෝ කුළුබඩු මිශ්‍රිත අල වර්ග, ගෙඩි, කරල් සහ පාරිභෝජනයට සූදානම් කර ඇති වෙනත් එවැනි ආහාර වර්ග
51. කෑමට සුදුසු ලෙස සාදන ලද සුළු ආහාර
52. ළදරු ආහාර
53. අයිස් ක්‍රීම්
54. බිස්කට්
55. ජෑම්, ජෙලි සහ මාර්මලේඩ්
56. මළු හෝ බහාලුම් තුළ ඇති රට ඉඳි, වියළි මිදි

57. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කේක් සහ පැණිරස කෑම වැනි රස කැවිලි
58. මළු හෝ බහාලුම් තුළ ඇති ක්ෂණික ආහාර වර්ග
59. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත ධාන්‍යමය ආහාර
60. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත භාජන පිරිසිදු කාරක සබන්, දියර සහ කුඩු වර්ග
61. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත වාහන පිරිසිදු කාරක, වාහන වාමුවා පිරිසිදු කාරක
62. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත ටයිල් පිරිසිදු කාරක, වීදුරු පිරිසිදු කාරක
63. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත ආයුර්වේද /ශාකාසාර නිෂ්පාදන
64. හිස ගල්වන තෙල්, හිස ගල්වන ජෙල් වර්ග, හිස ගල්වන ක්‍රීම් වර්ග, හිසකෙස් වර්ණකාරක
65. රෙදි සෝදන කුඩු (පතුරු සහ කැබලි) ළදරු රෙදි සේදුම්කාරක (කුඩු සහ දියර)
66. ෂැම්පු, කන්ඩිෂනර්, ශරීරයේ ගල්වන පුයර, කොලොන්, ශරීර ගල්වන ඉසින සුවඳ දියර, ළදරු නිෂ්පාදන ඇතුළුව ශරීර ආලේපන වර්ග
67. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත දන්තාලේප සහ මුඛ සේදුම්කාරක දියර
68. සබන් (ඇඟ ගල්වන, ඖෂධීය, කාබොලික්, ශාකසාර, රැවුල බෑමේ, මෘදු, දියර, කුඩා ළමුන් සඳහා වන සබන්, ස්නානය සඳහා භාවිත සබන්
69. ඇසුරුම් කළ හෝ බහාලුම්ගත වැසිකිලි සේදුම්කාරක සහ විෂබීජ නාශක
70. බහාලුම් තුළ අඩංගු ගෘහස්ථ විෂබීජ නාශක වර්ග
71. ඇසුරුම් කළ හෝ භාජන වල දමා විකුණනු ලබන ගෘහස්ථ මදුරුවන්, කෘමීන් මර්දන දියර හා ඉසිනයන්
72. ඇසුරුම්කළ හෝ භාජන වල දමා විකුණනු ලබන විෂබීජ නාශක දියර
73. ඇසුරුම් කර විකුණනු ලබන ට්‍රාන්සිස්ටර් හා විදුලි පන්දම් බැටරි වර්ග
74. සිමෙන්ති
75. කෘෂි කාර්මික පොහොර
76. කෘෂි රසායනික ද්‍රව්‍ය

මෙම විධානය වර්ෂ 2020 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පිළිවෙලින් 2003.08.25 දිනැති අංක 1303/1, 2004.01.21 දිනැති අංක 1324/1, 2005.08.26 දිනැති අංක 1407/23 හා 2001.03.22 දිනැති අංක 1698/2 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයන් මගින් ප්‍රකාශයට පත් කරන ලද විධාන අංක 2, 3, 4 සහ 35 යන විධානයන් මෙම විධානය මගින් පරිච්ඡින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි ;

ආචාර්ය ලලිත් එන් සෙනවීර,
සභාපති.

2019 අගෝස්තු මස 07 වැනි දින,
කොළඹ දී ය.

8 - 828

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.